# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

**නො. 9,683—1947ක්වූ මාර්තු මස 21 වෙනි දිනවූ සිකුරාදා.**

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මහර හිරගෙදරට වතුර සැපයීමට ලිඳක් හෑරීමට සහ වතුර එක්කාසුකරණ ස්ථානයක් තැනීමටත් මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට යථොක්තාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 2,061. ගම—කැන්දලියද්දපාලුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිල්ලගහවත්ත .. | අවුරුදු 1–5 පොල්පැල 26ක්ද, අවුරුදු 1–4 කොස්පැල 4ක්ද, අවුරුදු 10 කොස්ගහක්ද ඇති පොල් ඉඩම | කුරුවිටආරච්චිගේ ඉස්තිනුආප්පු, කැන්දලියද්දපාළුව, රාගම | 0 1 8·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ අප්‍රේල් මස 17වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ මාර්තු මස 17වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

පී. ජේ. සී. හරම්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙනුවට.

---

203 වැනි පරිච්ඡේදයේ නොම්බර හයේ වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—ගුරුදෙනියේ පූවක්පායේ වෙලෙහි ලිඳක් කැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක විධායක මණ්ඩලයෙන් නියමාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,160. ගම—ගුරුදෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පූවක්පායවෙල .. | කුඹුර .. | මහනුවර දළදා මාලිගාව වෙනුවෙන් ඩී. සී. රත්වත්තේ දියවඩන නිලමේතුමා | 0 0 0·8 |
| | | | | 0 0 0 8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ අප්‍රේල් මස 21වෙනි දින පෙරවරු 10යේ කාලයට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ මාර්තු මස 12වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. සී. ගුණවර්ධන,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පටබැදිමුල්ලෙ රජයේ මිශ්‍ර පාඨශාලාවක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩුකාරක සභාවෙන් නියමාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,017. ගම—අම්බලන්ගොඩ නගර සභාවතුල පටබැදිමුල්ල (කොටස).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පොතුන්ගහවත්ත, නො. 1 කොටසේ වර්පනම් නො. 404 සහ 406 කොටස | හුනු බැම්මෙන් බැඳපු උළු සෙවිලි ගොඩනැගිලි දෙකක්ද, හුනු බැම්මෙන් බැඳපු උළු සෙවිලි ගැරේජ් එකක්ද, හුනු බැම්මෙන් බැඳපු ලිං දෙකක්ද, හුනු බැම්මෙන් බැඳපු බාල්දියක්ද, හුනු බැම්මෙන් බැඳපු වැසිකිලියක්ද, අවුරුදු 40 පොල්ගස් 84ක්ද, අවුරුදු 30 කොස්ගස් 1ක්ද, අවුරුදු 30 දෙල්ගස් 11ක්ද, අවුරුදු 15 පුවක්ගස් 58ක්ද, අවුරුදු 5 දොඩම්ගස් 1ක්ද, අවුරුදු 20 කිලින්ගහක්ද ඇති ඉඩම | සීමාසහිත වෙව්පිනාඩ් බැංකුව, කොළඹ | 1 0 21·81 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ අප්‍රේල් මස 17වෙනි දින පෙරවරු 10යේ කාලයට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම් කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ මාර්තු මස 17වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වර්ග.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ජේ/ඒලාලේ ආණ්ඩුවේ අභ්‍යාස පාඨශාලාව ලොකුකිරීම පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝජකය උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 1,466. ගම—ඒලාලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාදරවලවු .. | වත්ත; මෙහි 10 අවුරුද්දක් වයසැති පොල්ගස් 7ක්ද, දෙහි ගස් 2ක්ද, කොස්ගසක් හා මාසිම් වැලේ අවුරුදු 15ගේ අඹ ගසක්ද පිහිටා තිබේ | ඒලාලේ පදිංචි කනපති නාගන් | 0 0 18·3 |
| 2 | එම .. | වත්ත; මෙහි අවුරුදු 10ක කොහොඹගසක්ද, අවුරුදු 20–30 දක්වාවූ පොල්ගස් 4ක්ද, අවුරුදු 3ගේ පොල්පැලයක් සහ අවුරුදු 1ක් වයසැති දෙළුම්ගසක්ද තිබේ | ඒලාලේ පදිංචි කන්දන් වේලන් | 0 0 18 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අයවර 1947ක්වූ ජූනි මස 9වෙනි දින උදේ 10ට ජපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

සැලකිය යුතුයි.—අයිතිකරුවන් වෙනුවට පෙනීසිටින්නන් අයිතිකරුවන්ගේ අත්සන් ඇති ලියමන් පෙන්වා සිටිය යුතුයි.

වර් 1947ක්වූ මාර්තු මස 13වෙනි දින ජපනේ කච්චේරියේදීය.

පී. ජේ. හබ්සන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත මහතා.

---

ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—අලංවෙල්ලක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මණ්ඩලයට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට බලය ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 866. ගම—කාසිකොටේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පහලකුඹුර .. | කුඹුර .. | (1) අමුණුගම එච්. ඇම්. සිංගිරිබංඩා, (2) මරදන්කඩවල එච්. ඇම්. රංහාමි, (3) කාසිකොටේ එච්. ඇම්. උක්කුබංඩා, (4) එම එම සිංගිරිබංඩා, (5) එම එම උක්කුඅම්මා | 0 0 5·07 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර් 1947ක්වූ මැයි මස 21වෙනි දින පෙරවරු 11ගේ කාලයමට අඹන්පොල ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර් 1947ක්වූ මාර්තු මස 17වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ඒ. ආර්. රත්නවෙල්,
ආණ්ඩුවේ උප ඒජන්ත මහතා.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස මාතර කච්චේරියේදී වර් 1947ක් අප්‍රේල් මස 22වෙනි දින පූ. භා. 10ට 1935ගේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සැම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් ඔහු වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇත හොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

ඇන්. මූනසිංහ,
අතිරේක ඉඩම් කොමසාරිස්තුමා.

වර් 1947ක්වූ මාර්තු මස 17වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

දීමට යන ඉඩම්වල විස්තර.

අවසාන ගම් සිතියමේ නො. 45. ගම—මොරවක් කෝරළේ කොටපොල.

| කැබැල්ලේ අංකය. | අවසරපත්‍රදරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 372T | ජෝන් ලේනාඩ් රොබට්ස් | 5 0 26 |
| 372AP | | 9 0 34 |
| 372AK | | 7 3 23 |
| 372AM | දොන් පේද්‍රිස් රනවීර | 5 2 23 |
| 445 | පේදුරිස් ප්‍රැන්සිස් අබේවික්‍රම | 10 2 31 |
| 445G | | 12 1 38 |
| 609 | ජෝන් ලේනාඩ් රොබට්ස් | 1 3 27 |
| 612 | දොන් බෙන්ඩික් අබේගුණරත්න | 18 3 28 |
| 616 | දොන් තිමෝතියස් අමරතුංග සිංජේ වඩින අමරකෝන් | 7 2 13 |
| 629 | සිලන්ලියනගේ රත්නායක | 10 1 10 |
| 615 | ගීගනගේ පීදිරික් සිල්වා වීරසූරිය | 9 0 29 |
| 706 | අමරකෝන්ගේ අබුහෙන්රිස් | 10 1 12 |
| 806 | රෙජිනා බාලසූරිය මහත්මිය | 22 3 30 |
| 814 | දොන් බෙන්ඩික් අබේගුණරත්න | 10 1 7 |

අවසාන ගම් සිතියමේ නො. 5. ගම—මොරවක් කෝරළේ දෙයාරකාවල.

| කැබැල්ලේ අංකය. | අවසරපත්‍රදරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 66 | දියස් සියසේන සේපාල හක්කොටුව | 8 2 3 |

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

1. සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් රජසන්තක ඉඩම්වල මැණික් ගැරීමේ අවුරුදු බද්ද වර් 1947ක්වූ අප්‍රේල් මස 9වෙනි දින සිට අවුරුද්දකට දෙන හෙයින් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් ඉල්ලුම්පත්‍ර වර් 1947ක්වූ අප්‍රේල් මස 9වෙනි දින පෙරවරු 10.30ට වනතුරු භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍රයේ සඳහන් මුදල ඉලක්කමෙන්ද අකුරෙන්ද ලිය යුතුයි. ඉලක්කමෙන් ලියූ මුදල අකුරෙන්ද ලියූ මුදලට වෙනස්වද නොහොත් ලියූ මුදල අකුරෙන් නොතිබුනොත් ඉල්ලුම්පත්‍රය භාරනොගෙනීමට ඉඩ ඇත.

3. ටැන්ඩර් දිනයට කලින් එක එක ඉඩමට නොහොත් දෙලකට වෙන් වෙන් වශයෙන් රුපියල් 25 බැගින් රත්නපුරේ කච්චේරියේ තැන්පත්කළ යුතුයි. ඒ ඒ ඉඩම ඉල්ලුම්කරණ ටැන්ඩරයට රුපියල් 25ගේ කුවිතාන්සියද අමුනා තිබිය යුතුයි.

4. "Tender for the Right to Gem" යනුව, "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ලියුම් කවරයේ පිටුපිට ලියයුතුයි—එක එක ඉඩමට නොයෙකුත් දෙලකටද වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර දැමිය යුතුයි. ඒ ඒ ඉඩමට කලින් බැඳපු මුදලේ කුවිතාන්සිය ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතුයි.

5. ඉඩම් ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට පෙනෙන්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයක් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය. යම්කිසි මිටක සතුටුදායක ටෙන්ඩර් ඉඩම්වලට නොහිමුණේවිනම් එම ඉඩම් වකාම ටෙන්ඩර්සියේ විකිණීම කල්පනාකරනු ලැබේ.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාර නොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ වෙත තබා ගන්නාලදී.

7. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවේලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම ආදිය සඳහා බඳුකරයකට ඇතුල්වෙන්ට ඕනෑය. බදු ඉඩම ලබාගන්ට බැරිවූන අයගේ ඉහත සඳහන් මුදල වන රුපියල් 25 ආපසු දෙනු ලැබේ. ටෙන්ඩරය භාරගත් අය බදුමුදල් සම්පූර්ණයෙන් නොගෙවීමෙන් රුපියල් විසිපහ රජයන්තක කරනු ලැබේ.

8. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරනලද ඉඩම්වල පතල් හෑරීමේදීයට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙන ලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් තිස් දවසක් ඇතුලතදී කච්චේරියේ බඳින්ට ඕනෑය.

9. මෙම ඉඩම්වල බිම් ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් හෙයකින් ඉඩම්වල හරි සම්පූර්ණ බිම් ප්‍රමාණය මෙහි පහත සඳහන් බිම් ප්‍රමාණයට වඩා අඩු බව දෙවනු පෙනීගියහොත් එම වෙනස සියයට 10ක් (10%) වැඩි නූතිනම් බිම් ප්‍රමාණයේ අඩුලුහුඩුකම සම්බන්ධව මුදල් ආපසු ගැනීමට හෝ අඩුකරගැනීමට කරන ඉල්ලීම් ආණ්ඩුව විසින් කල්පනාවට ගනු නොලැබේ.

10. බද්ද වලංගු කාලය තුල බදුදෙන්ට යෙදෙන ඉඩමේ ඇති ගස්වල යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරි වැවෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

11. ඉඩම් ඉල්ලුම්කාරයෝ තම තමන් ඉල්ලුම්කරනලද ඉඩම් වැඩ පටන්ගන්නා දිනය කොළඹ ලෝහ පරීක්ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

12. වැඩිදුර කාරණා සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

ඉඩම් විස්තර.

(1) කොලොන්නාකෝරලේ කුඹුරුගමුවේ පිහිටි දිගින් දම්වැල් 10ක් පමණ විශාලකම ඇති කුඹුරුගමුවේ ගසට මායිම්:—

උතුරට: දකුණු ඉවුරද,
නැගෙනහිරට: කුඹුක්ගසද,
දකුණට: වම් ඉවුරද,
බස්නාහිරට: කුඹුක්ගසද.

(2) කුරුවිටකෝරලේ නාකන්දල පිහිටි දිගින් දම්වැල් 50ක් පමණ විශාලකම ඇති නාකන්දලඹයට මායිම්:—

උතුරට ලොට් නො. 23හේ දකුණු කෙලවරද,
දකුණට: එල්ලාවල ගම් මායිමද,
නැගෙනහිරට: වම් ඉවුරද,
බස්නාහිරට: දකුණු ඉවුරද.

(3) කුරුවිටි කෝරලේ කරඳන පිහිටි දිගින් දම්වැල් 20ක් පමණ විශාලකම ඇති එරවික්ඔයට මායිම්:—

උතුරට: ලොට් නො. 419–444 සහ දෙලේ ඉතුරු කොටසද,
නැගෙනහිරට: වම් ඉවුරද,
දකුණට: ලොට් නො. 453A සහ 455 සහ දෙලේ ඉතුරු කොටසද,
බස්නාහිරට: දකුණු ඉවුරද.

(4) නවදුන්කෝරලේ කරන්ගොඩ පිහිටි දිගින් දම්වැල් 24ක් පමණ විශාලකම ඇති ගල්දෙලට මායිම්:—

උතුරට: දකුණු ඉවුර සහ T. P. 346,131,
නැගෙනහිරට: නො. 72 පැලැනේ ලොට් නො. 2,
දකුණට: වම් ඉවුර,
බස්නාහිරට: නො. 72 පැලැනේ ලොට් නො. 3.

(5) නවදුන්කෝරලේ දෙනවක පාහකඩ පිහිටි දිගින් දම්වැල් 13ක් පමණ විශාලකම ඇති කුකුලේගේඅස්සැද්දුමේ දෙලට මායිම්:—

උතුරට: ලොට් නො. 200 උතුරු ගල්කනුව සහ දෙලේ ඉතුරු කොටසද,
නැගෙනහිරට: දකුණු ඉවුරද,
දකුණට: ලොට් නො. 201හේ දකුණු පැත්තේ ගල්කණුව සහ දෙලේ ඉතුරු කොටසද,
බස්නාහිරට: වම් ඉවුරද.

(6) අටකලන්කෝරලේ මඩලගම පිහිටි දිගින් දම්වැල් 15ක් පමණ විශාලකම ඇති හන්ගොමුගගට මායිම්:—

උතුරට: දකුණු ඉවුරද,
නැගෙනහිරට: ගගේ ඉතුරු කොටසද,
දකුණට: වම් ඉවුරද,
බස්නාහිරට: නවදුන්කෝරලේ ගම් මායිමද.

(7) නවදුන්කෝරලේ මාරපන පිහිටි නො. 92 පැලැනේ ලොට් නො. 115J අක්කර 1½ක් පමණ විශාලකම ඇති මහ ඉත්තෑවෙඩුකලංහ, මැවගාවාකැලේ නැමැති ඉඩමට මායිම්:—

උතුරට: ලොට් නො. 115J ඉතුරු කොටස,
නැගෙනහිරට: ලොට් 115F,
දකුණට: ලොට් 115J ඉතුරු කොටස,
බස්නාහිරට: ලොට් 115I.

(8) නවදුන්වකෝරලේ දෙනවක පාහකඩ පිහිටි නො. 161 පැලැනේ ලොට් නො. 28J, අක්කර 3 පර්චස් 20ක් පමණ විශාලකම ඇති කුරුවත්තෙන්නෙන සහ ගල්අමුණේදෙල සහ දෙනවකගග දිගින් දම්වැල් 12ක් සහ 10ක් පමණ විශාලකම ඇති ඉඩමට සහ දෙලවලට මායිම්:—

උතුරට: ලොට් 28I, 28K, 28L සහ 28M,
නැගෙනහිරට: ගල්අමුණේදෙලේ වම් ඉවුරද,
දකුණට: දෙනවක්ගගේ වම් ඉවුරද,
බස්නාහිරට: දෙනවක්ගගේ ඉතුරු කොටස සහ ලොට් නො. 24ද.

ඩී. වනසුන්දර;
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා වෙනුවට.

වම 1947ක්වූ මාර්තු මස 15වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

---

දැන්වීමයි.

මාතර දිස්ත්‍රික්කයේ කඩවත්සතර සහ වැල්ලබඩපත්තුව, ගගබඩපත්තුව, කන්දබඩපත්තුව, වැලිගම් කෝරළය සහ මොරවක් කෝරලයේත්, පිහිටි කුඹුරුවල 1947 යල් කන්නයට වී ගොවිතැන් 1943ක්වූ සැප්තැම්බර් මස 27වෙනි දින අංක 9,176 දරන විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධකරණලද ආරක්ෂක (වී ගොවිතැන්) නියෝගයන්හි 2 වැනි නියෝගයෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර මෙහි පහත පෙනෙන දිනයන්හිදී හෝ ඊට ප්‍රථමයෙන් ආරම්භකළ යුතු බව මෙයින් නියමකරන්ට යෙදුනා ඇත:—

(1) කඩවත් සතර හා වැල්ලබඩපත්තුව, 1947 මාර්තු 26වෙනි දින.
(2) ගගබඩපත්තුව, 1947 මාර්තු 26වෙනි දින.
(3) කන්දබඩපත්තුව, 1947 මාර්තු 25වෙනි දින.
(4) වැලිගම් කෝරලය, 1947 මාර්තු 24වෙනි දින.
(5) මොරවක් කෝරලය, 1947 මාර්තු 28වෙනි දින.

2. තවද ඉහත සඳහන් දිනයන්හි හෝ ඊට ප්‍රථමයෙන් වැඩ ආරම්භනොකළ කුඹුරු බිම් ඇතිවුනි නම් එවැනි කුඹුරු බිම් මාගේ පාලනයට ගැනීමට ඉහත සඳහන් කළ නියෝගයන්හි (3)වෙනි නියෝගයෙන් මට බලය පැවරී තිබෙන බවද වැඩිදුරටත් දන්වමි.

අත්සන්කෙලේ,

ඇම්. රාජේන්ද්‍ර,
මාතර උප දිසාපතිතුමා.

වම 1947ක්වූ මාර්තු මස 12වෙනි දින
මාතර කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.